ඌවපරණගම ප්‍රාදේශීය සභාව.

**2022.05.12 වන දින පැවති මහ සභා වාර්තාව**

## 01.පිළිගැනීම

මෙදින පෙ.ව.09.30ට ආගම සිහි කිරීමෙන් පසු පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,මන්ත්‍රී මණ්ඩලය ද ඇතුළු සියලු දෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 02.පැමිණීම .

| | |
|---|---|
| 1. කේ.ඒ.සමින්ද සුදර්ශන මැතිතුමා | ගරු සභාපති |
| 2 ආර්.ඩී.ගුණපාල මැතිතුමා | ගරු උප සභාපති |
| 3. ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 4. ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. එම්. කාංචනා රුවන්මාලි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 6. ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. ඩී.එම්. තිලකරත්න බණ්ඩා මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10 ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ආර්.එම් නාලිනි රාජපක්ෂ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 12. ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. කේ.එම්.කරුණාතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. ඩී.එම්. කරුණාදාස මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.ජී.ඒ සරත්චන්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඒ.පී.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21.එම්.එම් සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 22. එම්.එම්.නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 23. ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 24. එල්.එච්.ධර්මසේන මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 25. ඩබ්ලිව්.ජී.විජේසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. එස්.අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 28 පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. ඩී.එම්.කමල් දේශප්‍රිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 30. ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි |
| 31.ඩබ්.එම්. ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 32. ඩබ්.එම් ජයසේකර මැතිතුමා. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 33. ටී.ඩබ්.ජී. උපසේන වැව්වත්ත මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

**පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම. –**

**සංශෝධන:** පසුගිය සභා වාර්තාවේ පිටු අංක 17හි ඩබ්.ජී.විජේසිංහ මැතිතුමා,ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා අංක 02 සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කල ලෙස සටහන් විය යුතු අතර, පක්ෂව ඡන්ද 28ක් ද විපක්ෂව ඡන්ද 03ක්,නොපැමිණි හා සභා ගර්භයේ නොසිටි 06ක්ද සහිතව වැඩි ඡන්ද 25කින් බැකෝ ලෝඩර් යන්ත්‍රය හා ලොරි රථ කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම සඳහා වූ යෝජනාව සභා සම්මත වූ බව සටහන් විය යුතුය.

2022.04.07 දිනැති මහා සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.කරුනාතිලක මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සංශෝධනයට යටත්ව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-**

- ❖ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාට 2023 වර්ෂයේ අයවැය සකස් කිරිම සඳහා සංවර්ධන යෝජනා ලබා දීමට කටයුතු කරන මෙන් නිවේදනය කරන ලදි.

- ❖ වැලිමඩ ප්‍රාදේශීය (මාර්ග) ඉංජිනේරු කාර්යාලය වෙතින් ඌවපරණගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සවිකර ඇති ග්‍රාමීය මාර්ග නාම පුවරු කිහිපයක් නිවැරදි විය යුතු බව දන්වා එවා ඇති බවත්, එම මාර්ග පුවරුවල සඳහන් කර ඇත්තේ 2014.04.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ එම මාර්ග ගැසට් කර ඇති නාමය නාම පුවරුවල සඳහන් කර ඇති බව නිවේදනය කරන ලදි.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි,ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා අසනීප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර, ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි,එස්.එම්.සුජිත් ප්‍රසන්න මැතිතුමා අසනීප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර, ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි,නාරායනන් වරදරාජ් මැතිතුමා අසනීප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර, ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,කන්දසාමි පේරම්බිගයි මැතිතුමිය අසනීප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර, ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම්,පැමිණිළි හා සන්නිවේදන ලිපි;-** නැත

**04.යථාපරිදි කල් දී ඇති ප්‍රශ්ණ :-** නැත

**05.යථාපරිදි කල් දීඇති යෝජනා :-**

**<u>යෝජනා අංක 01 - සමිති ලියාපදිංචි කිරීම.</u>**

2019.07.22 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශය මත ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මෙතෙක් ලියාපදිංචි නොකළ පහත නම් සඳහන් මරණාධාර/සුභ සාධක/අනෝන්‍යාධාර හා පරෝපාකාර සමිති ලියාපදිංචි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | සමිතියේ නම හා ලිපිනය |
|---|---|
| 01 | ශ්‍රී සංඝමිත්තා කාන්තා සමිතිය,කිරවනාගම,ලුණුවත්ත |
| 02 | කබිල්ලදෝව පොදුජන ගැමුණු මරණාධාර හා සමාජ සේවා සංගමය, කබිල්ලදෝව, ගලහගම,හග්ගල |
| 03 | යශෝධරා කාන්තා සමිතිය,මහකුඹුර,තුප්පිටිය,බඹරපාන |
| 04 | එකමුතු සහනාධාර සමිතිය,පිටියකුඹුර,සරලපතන,බඹරපාන |
| 05 | සුමිතුරු කාන්තා සමිතිය,උඩුහුල්පොත,කටුගල්ල,අඹගස්දෝව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද සමිති ලියාපදිංචි කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**
මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.
ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 02 - පරිගණක යන්ත්‍ර මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම</u>**
2022.02.25 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි කාර්යාලයේ ආදායම් අංශය සඳහා පරිගණකයක් සහ UPS 08ක් මිළදී ගැනීම වෙනුවෙන් බදුල්ල,ඔෆිස් වන් ආයතනය වෙත ගෙවිය යුතු රු.280,300.00ක බිල්පත පියවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 02 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 03 - වැසිකිලි ආධාර ලබාදීම</u>**

2021 හා 2022 වර්ෂවල වෙන්කර ඇති සභා අරමුදලින් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වැසිකිලි ඉදිකිරිම සඳහා ඔවුන්ගේද ශ්‍රම දායකත්වය සැපයීමේ පදනම මත රු.50,000.00ක මුදලක් අදියර දෙකකදි ඉදිකිරිම් කටයුතුවල ප්‍රගතිය සලකා බලා මුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 03 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 04 – මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඉන්දන ලබාදීම</u>**

කොවිඩ් මර්දන කටයුතු හා ඒ ආශ්‍රිත කටයුතු වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ඉන්දන ලීටර් 12ක් බැගින් ලබා දීමට කටයුතු කර ඇත. එහෙත් මේවනවිට පවත්නා ඉන්දන මිළ ගණන් හා ජාතික ඇයවැය චක්‍ර ලේඛ අංක 3/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරිමට සිදුවීමත්, මේවන විට එකී කොවිඩ් මර්දන කටයුතු ක්‍රියාත්මකවීමේ අඩුවක්ද පවතින බැවින්,පෙර ඉන්දන ලීටර් 12ක් සඳහා වැයකර ඇති මුදලට සරිලන සේ ඉන්දන ප්‍රමාණයක් ලබාදීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති,ආර්.ඩී.ගුණපාල මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**

ගරු සභාපතිතුමනී, ප්‍රාදේශීය සභාවෙන් මහජනතාවට සපයන සේවාවන් අතර මහජන සෞඛ්‍ය ප්‍රමුඛත්වයක් ගන්නවා. ඌවපරණගම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් නව දෙනෙක් ඉන්නවා.දැනට සේවයේ යෙදී සිටින්නේ හය දෙනයි. මොවුන් ඌවපරණගම ආසනය තුළ විශාල ක්‍රියාවලියක් සිදු කරනවා. මේ ලබා දෙන ඉන්දන ලීටර් 12ත් මදි. මේ යෝජනාව සම්මත වුණාට පසුව ලීටර් 4ක් හෝ 5ක් තමයි ලැබෙන්නේ. ප්‍රමුඛතාවය ලබාදිය යුතු සේවාවන් සඳහා ඉන්දන ප්‍රමාණය සීමා කලොත් ඒකේ පීඩනය එන්නේ මහජනතාවට. මේ දිනවල ඩෙංගු රෝගය පැතිරීමේ අවධානමත් වැඩියි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ඉන්දන ලීටර් 12ම ලබා දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා :-**

මහ නගර සභාවක් නොවන නිසා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මහත්වරු අපි යටතේ නෙවෙයි සේවය කරන්නේ.අපේ පනතින් පැවරී තිබෙන බලතල අනුව අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා මඟින් ක්‍රියාත්මක කරනවා.ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා තමයි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා හා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු සහ සියලු දෙනාම පාලනය වෙන්නේ සහ නියාමනය වෙන්නේ. වර්තමාන මේ සභාවේදී තමයි අපි යෝජනාවක් ගෙනල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඉන්දන ලීටර් 12ක ප්‍රමාණයක් ලබා දීමට තීරණය කලේ දිරිගැන්වීමක් විදිහට. මීට අමතරව නිල වශයෙන් සෑම මසකම රු.1000.00ක ගමන් වියදමක් ගන්නවා. ආහාර පනත ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් වැයවෙන මුදල් ගෙවනවා.සුනඛ එන්නත් වැඩසටහනට යනවිටත් වාහනය සහ නිලධාරින් අපෙන් යොදවන්නේ. ඩෙංගු මර්දන වැඩසටහනේදීත් භූමිතෙල් සහ අවශ්‍ය වාහන දෙන්නෙත් අපෙන්. කිසිසේත්ම අපි ඔවුන්ට ලබාදුන් මුදල කප්පාදු කරලා නැහැ.ලැබෙන ඉන්දන ප්‍රමාණය විතරයි අඩු කරලා තියෙන්නේ. එදා පැවතුණ මිලත් සමඟ අපි අයවැය තුළ මුදල් වෙන් කරලා තියෙන්නේ ලීටර් 12ක ප්‍රමාණයට.අද ලීටර් 12ම ලබා දුන්නොත් අපේ අයවැය කඩා වැටෙනවා. පරිපූරකයක් දාන්න වෙනවා. රජයෙන් චක්‍ර ලේඛනයක් එවලා තියෙනවා වියදම් කළමනාකරණය කර ගන්න කියලා රටේ තියෙන තත්ත්වයත් එක්ක. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මේ තීරණයට එකඟයි.ඔවුන්ට අපි සද්භාවයෙන් ලබා දුන්

දෙයක් මිස නීත්‍යානුකූලව ලැබිලා කප්පාදු කිරිමක් නෙවෙයි කරන්නේ. අපි සියලු දෙනාම අපහසුතාවයට පත්වෙනවා මුදල වැඩිවීම තුළ කළමනාකරණය කර ගැනීම. උදාහරණයක් විදිහට කාර්යාල ලිපිද්‍රව්‍ය සඳහා අවුරුද්දටම අයවැය තුළ වෙන්කල ප්‍රමාණය අවසන්වීගෙන එනවා. තව මාස අටක් තියෙනවා. මාස හයක් විතර තමයි යන්න පුළුවන්. මම කාර්ය මණ්ඩලයට කීවා මගේ ගමන් වියදම් ආදියෙන් 50%ක් අඩු කරන්න කියලා. මන්ත්‍රීවරුන් සමඟ කතා කරලා තේ එක පවා අඩු කරන්න කටයුතු කරන්නම් කියලා කීවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 05– ජල ගබඩාව සඳහා ජල උපාංග මිළදී ගැනීම</u>**

ඌවපරණගම ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කරනු ලබන ජල යෝජනා ක්‍රම 13 නඩත්තු කිරිම් කටයුතු සඳහා මෙම වර්ෂයේ අයවැය තුළින් වෙන්කර ඇති ප්‍රතිපාදන මත රු.400,000.00ක ජලනල උපාංග මිළදී ගැනීමටත්, මිළදී ගැනීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදු කිරිම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති,ආර්.ඩී.ගුණපාල මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 06 – ඌවපරණගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉඩම් අනු බෙදුම්වලට බෙදීමේ සීමා සඳහා අනුමැතිය ලබා ගැනිම</u>**

ඌවපරණගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉඩම් අනුබෙදුම් සීමාව නිවාස හා වාණිජ ඉඩමක් සඳහා පර්චස් 06ක් බව 2007.10.30 දින අංක 04.11 දරණ සභා සම්මතයක් පිළිගෙන ඇත. එහෙත් වර්තමානයේ ඉදිරිපත්වන වානිජ ගොඩනැගිලි ඉදිකිරිම් සඳහා වන අයදුම්පත්‍ර වල ඉඩම් ප්‍රමාණයන් සලකා බලා වානිජ ස්ථාන සඳහා පමණක් එකී සීමාව පර්චස් 03ක් ලෙස සලකා අනු බෙදුම් අනුමත කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඒ.පි.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 07 – ලුණුවත්ත අංක 23 කඩ කාමර පැවරීම</u>**

ලුණුවත්ත නව නගරයේ අංක 23 දරන කඩ කාමරය දැනට ලුණුවත්ත, වැගෙදර ලිපිනයේ පදිංචි ටි.රවිචන්ද්‍රන් යන අය නමින් පවතින අතර,ඔහු විසින් ලුණුවත්ත, හ්‍යුගෝලන්ඩ්වත්ත, අංක 31හි පදිංචි පි.මෝහනරාජ් යන අයට මෙම ප්‍රාදේශීය සභාවේ පවත්නා ක්‍රමවේදයට අනුව පැවරුම් ගාස්තු ලෙස 2022.02.10 දින සභා සම්මුතියෙන් නියම කර ගන්නා ලද ගාස්තු අය කිරිමෙන් පසු පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 08 - ඉඩම් කොටසක් හුවමාරු කර ගැනීම</u>**

2021.05.13 දින පැවති මහ සභාවේ යෝජනා අංක 04 අනුව ලුණුවත්ත මාර්ග සංවර්ධනයේ දී වෙන්වූ ලූණුවත්ත ගිණිකටුකැලේ සුසාන භූමියේ කොටසක් හා පාලිත මොහොට්ටි මහතාගේ ඉඩම් කොටසක් හුවමාරු කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට සහා අනුමැතිය ගෙන ඇත. මෙය ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කලද පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/4/3/1/12(187) හා 2022.04.08 දින ලිපියට අනුව එම ඉඩම සුසාන භූමියක් ලෙස වෙන්කර ඇත්නම් එවැනි ඉඩමක් බැහැර කිරිමේ හැකියාව පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි ආඥා පනතේ 12 වගන්තිය අනුව සිදුකල නොහැකි බව දන්වා ඇත.

එහෙත් එම ආඥා පනතේ 5(3) වගන්තිය ප්‍රකාරව සුසාන භූමියේ කොටසක් නිදහස් කිරිමේ හැකියාව විෂය භාර අමාත්‍යවරයාට ඇති බැවින්,පළමුව එකී සුසාන භූමියේ කොටසක් සුසාන භූමියක් ලෙස භාවිතයෙන් නිදහස් කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.කාරක සභා වාර්තා සලකා බැලීම - නැත**

පෙ.ව.11.20ට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී,පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**07.ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන සලකා බැලීම :-**

2022.04.01 දින සිට 2022.04.30 දින දක්වා වන මාසික ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශනය සලකා බලා අනුමත කරන ලදි.

පෙ.ව.11.25ට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි,එම්.එම්.සුනේත්‍රා නන්දනී මැතිතුමිය සභාවට පැමිණෙන ලදි.

**මිළ ගණන් විවෘත කිරිම**

**I. බැටරි සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | කාංචනමාලි ටයර් සර්විස්, බණ්ඩාරවෙල පාර,වැලිමඩ | M.R.F.ටයර් සර්විස්, නුවරඑළිය පාර, වැලිමඩ | රන්දිලු ටයර් සර්විස්, බණ්ඩාරවෙල පාර, වැලිමඩ |
| 1 | බැටරි 01ක් (AM 65) | 37,900.00 | 39,700.00 | 36,600.00<br>වසර දෙකක වගකීම්කාලයක් සහිතයි |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් හා වසර දෙකක වගකීම් කාලයක් ලබා දී ඇති රන්දිලු ටයර් සර්විස් වෙතින් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**II. උල්හිටිගොඩ ජල යෝජනා ක්‍රමයේ ජල පොම්පය අලුත්වැඩියා කිරිම සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | |
|---|---|---|---|
| | | යුනික්‍රෝ මෝටර්ස්, කහටතලාව,වැලිමඩ | රෝහන මාරසිංහ, කළමනාකරු, ටෙක්නිකල්/ඔපරේෂන් |
| 1 | ජල පොම්පය පරික්ෂා කර බලා අලුත්වැඩියා කිරිම සඳහා | 63,000.00 | 68,000.00 |

මේ සඳහා ආයතන තුනකින් මිළ ගණන් කැඳවන ලදි.ගාමිණී කුමාර යන අය විසින් මිළ ගණන් ලබා දී නොතිබු අතර, අනෙක් ආයතන දෙකෙන් මිළ ගණන් ඉදිරිපත් කර තිබු හෙයින් යුනික්‍රෝ මෝටර්ස් වෙතින් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

III. ජල නල සහ උපාංග සඳහා මිළ ගණන්

ජල නල සහ උපාංග සඳහා ඇන්ටන් ආයතනයෙන් සහ එස්ලෝන් ආයතනයෙන් මිළ ගණන් ලබාදීම ප්‍රතික්ෂේප කල අතර, ඇන්ටන් ආයතනයෙන් මිළ ගණන් ලබා දී තිබුණි.එම මිළ ගණන් අනුව ද්‍රව්‍ය සපයා ගැනීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදි.

**08.වෙනත් කරුණු :-**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා :-**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. උළුගල ග්‍රාම සේවා වසමේ තැපැල් කන්තෝරුව තියෙන තැන පවත්වාගෙන යනවා කාබනික පොහොර නිෂ්පාදනය කරන ස්ථානයක්. ඒ ස්ථානය නිසා මේ වෙනකොට උළුගල රාජමහා විහාරස්ථානයටත්, උළුගල ගම්මානයේ සියලුම ගම්වැසියන්ටත් විශාල බාධාවක් වෙලා තියෙනවා මැස්සෝ බෝවීම නිසා. ඒ වගේම වැස්ස වෙලාවට නොයෙකුත් අපද්‍රව්‍ය සෝදාගෙන යනවා. මේ නිසා ලොකු අවධානමක් තියෙනවා.ඒවගේම ඔහුට අවවාද ලබාදී නීතිරීති මාලාවක් පැනවිය යුතුයි. මේ ගැන අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා

අනෙක් කාරණය තමයි පහුගිය දින කිහිපයේම රටේ ඇතිවුන තත්ත්වය. නිර්පාක්ෂික අරගලකරුවන්ට එල්ලවුන ප්‍රහාරය අපි සියලු දෙනාම හෙලා දකිනවා. විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.නැත්නම් අපි දේශද්‍රෝහියෝ රටට. එයින් කරදරයට පත්වුණ සැම දෙනාටම අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. මේ තත්ත්වය උදා වෙනවා කියලා අපි කීවේ මීට මාස හය හතකට කලින්. ඒ අදහස ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දුන්නේ නෑ සමහර අය අපට මේ සභාවේදි. අපි ප්‍රාර්ථනා කරමු ඉදිරියට රටේ වගකීම භාර අරගෙන කරන්න අගමැති කෙනෙක්,ජනාධිපති කෙනෙක් පත්වෙලා හොඳ අනාගතයක් රටේ සියලුම දෙනාට උදාවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම රටේ නායකයින් පත්කරගන්න කොට අත්දැකීම් තියෙන පුද්ගලයින්,රටේ පුරවැසියන් ගෙනත් තිබුණා නම් අද මේ දේ සිද්ධ වෙන්නේ නෑ කියන දෙයත් ප්‍රකාශ කරමින් කරදරයට අපහසුතාවයට පත් වූ සියලු දෙනාටම කණගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා :-**
මම ගියා ඔය කියන ප්‍රශ්නය තියෙන ස්ථානයට.මම දැක්කා ඒ ප්‍රශ්නය. මම ඒ වෙනකොටත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයා දැනුවත් කරලා තිබුණේ. අපේ කණ්ඩායමක් යවන්න බලාපොරොත්තු වෙනවා පරිසර තත්ත්වය පරීක්ෂා කර බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා :-**
මුලින්ම දේශපාලන පක්ෂයක් විදිහට මියගිය හා අපහසුතාවයට පත්වුණ සියලු දෙනාටම අපේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. දේශපාලනික වශයෙන් එල්ලවෙන චෝදනා වෙනම කතාවක්. මටත් පක්ෂයෙන් පණිවිඩයක් ආවා මේ තත්ත්වය පාලනය කරන්න මැදිහත් වෙන්න කියලා. සමාජ මාධ්‍ය ජාලයේ ප්‍රචාරයක් ගියා ඌවපරණගමත් බලලා අපි ගහමු අන්න වැඩේ කියලා. මම ආයාචනාත්මකව ඉල්ලීමක් කරනවා අපි තමයි දේශපාලනය නියෝජනය කරන ප්‍රමුඛතම මේ තිස්හත් දෙනා.කොහේ හරි ගෙයක්,වාහනයක් ගිනි ගත්තා නම් අතක් පයක් කැඩුනා නම් ඌවපරණගම අපටම වෙන හානියක්. මේ සියල්ල සොරකම් කරලා ගත්ත දේවල් නෙවෙයි.දුක් මහන්සිවෙලා හම්බ කර ගත්ත දේවල්.

**ගරු සභාපතිතුමා :-**

අදහස් දැක්වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා දෙපලටම ස්තූතිවන්ත වෙනවා. පක්ෂයක් විදිහට නොව මම ඌවපරණගම ප්‍රාදේශීය සභාව විදිහට මේ සිද්ධියෙන් අගතියට පත්, දේපල හානිවුන සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ට අපේ සභාවේ කණගාටුව මේ වෙලාවේ ප්‍රකාශ කරමින් සභාවේ කටයුතු අවසන් කරනවා.

ඒ අනුව පෙ.ව.11.30 ට ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ස්තූතියි.

මෙයට - විශ්වාසී,

සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව.

මෙම සභා වාර්තාව ....................... වන දින පැවති මහ සභාවේදී ....................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ යෝජනාවෙන් ...................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/සංශෝධනයට යටත්ව සභා සම්මත විය.